**හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (ව්‍යාපෘති I) - 2019**

---

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (ව්‍යාපෘති I) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 නොවැම්බර් 20 දින එළඹි අංක 47037 - එස්ආර්අයි දරණ ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

වැඩසටහනේ පහසුකම් පරිපාලන අත්පොතට අනුව, විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනයවන අතර ලංකා විදුලිබල මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ පිවිතුරු විදුලිබල උත්පාදනය, පද්ධති කාර්යක්ෂමතාවය හා විශ්වාසනීය බව වැඩිදියුණු කිරීමයි. පරිපාලන අත්පොතට අනුව, වැඩසටහනේ අස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 28,509.80 කට සමාන එජඩො මිලියන 220 ක් වන අතර, ඉන් රු. මිලියන 23,325.50 කට සමාන එජඩො මිලියන 180 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 5,183.60 ක් මූල්‍යනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය අපේක්ෂා කෙරේ. ව්‍යා වැඩසටහන එහි කටයුතු 2015 පෙබරවාරි 02 දින ආරම්භ කරන ලද අතර 2019 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, වැඩසටහනේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ

නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ප්‍රංශ නියෝජිත ආයතනයේ (AFD) දායකත්වය සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ CS -DRMS වාර්තාවේ දැක්වෙන ශේෂය සහ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය අතර රු.9,584,574 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශනවල ණය ශේෂය අඩුවෙන් දැක්වේ. | 2020 ජනවාරි මස 2019 මූල්‍ය වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට සහ ඉදිරිපත් කරන අවස්ථාවේදී විදේශ මුදල් වියපැහැදම් සඳහා වූ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන (DRMS-වාර්තාව) යාවත්කාලීන වී නොතිබුණි.එම නිසා 2019 දෙසැම්බර් AFD අත්තිකාරම් අග්‍රිම වියපැහැදම්වීම් ගණුදෙනු සිදුවූ දින ශ්‍රී ලංකා මහ බැංකුවේ පැවති විනිමය අනුපාතය මත ගිණුම්ගත කර තිබේ. 2019 මූල්‍ය වර්ෂය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වියපැහැදම් පිළිබඳ ප්‍රකාශය 2020.02.27 දින ප්‍රසිද්ධ කර තිබුණි. එම නිසා ගණුදෙනු සිදුවූ දින ශ්‍රී ලංකා මහ බැංකුවේ පැවති විනිමය අනුපාතය සහ DRMS වාර්තාවේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව යොදා ගන්නා ලද විනිමය අනුපාතය අතර රු.9,584,574 ක වෙනස ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල 2020 මැයි ගිණුම්ගත කර ඇත. එම නිසා ඉහත වෙනස 2020 මූල්‍ය වර්ෂයේ දී නිවැරදි කර ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලයේ සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ DRMS වාර්තාවේ දැක්වෙන මුදල සමග එකග වේ. | ණය මුදල් වාර්තාකිරීම සඳහා එම මුදල් ලැබුණු දිනයේ පැවති විනිමය අනුපාතය යොදා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | LKAS 01 ට එරෙහිව රු.9,925,801 විනිමය ලාභය පොළී ලැබීමක් ලෙස වර්ගීකරනය කර තිබුණු අතර මූලය ප්‍රකාශනවල 2018 වර්ෂයේ සංසන්දනාත්මක සංඛ්‍යාවල දක්වා තිබුණි. | ලාභය වැරදි ලෙස වර්ගීකරනය හේතුවෙන් තීරණ ගැනීම සඳහා බලපානු ඇත. | ව්‍යාපෘති ශාඛාවේ අතිරේක මූල්‍ය කළමණාකරු විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාවල මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය 2018 තුලදී ඇතිවූ රු.9,925,801 ක විනිමය ලාභය නිවැරදිව වර්ගීකරණය කර ඇති අතර විනිමය අනුපාත ලාභයක් ලෙස ගිණුම් ගත කර ඇත. මූල්‍ය වර්ෂ 2018 සහ 2019 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කෙරීගෙන යන වැඩ පිළිබඳව ප්‍රකාශනයක පිටපතක් ඇමුණුම 1හි දක්වා ඇත. ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කරනලද ඒකාබද්ධ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල වර්ගීකරණ වැරදි යන වචනය නිවැරදි කල හැක. | මූල්‍ය ප්‍රකාශනවල ලාභ අයිතමයන් නිසි පරිදි වර්ගීකරණය කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | වැඩසටහනේ 3 වන කොටසේ රු.1,203,511 වටිනා ස්ථාවර වත්කම් මත ක්ෂය වෙන් කිරීම් සිදු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වැඩ පිරිවැය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | ව්‍යාපෘතියේ නියම පිරිවැය නිරූපනය නොවන අතර කෙරීගෙන යන වැඩ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වේ. | ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුදල් මගින් මිළදී ගන්නා ලද ස්ථාවර වත්කම් (ඒජීඑම්) බෙදා හැරීමේ අංශය 2හි මාරු වවුචර්පත් භාවිතයෙන් වාර්තාකර ඇති අතර මෙම වත්කම්වලට අදාල ක්ෂය ප්‍රමාණය මෙම අංශයේ වාර්තා කර ඇත. ගැලපුම් සංකල්පය අනුව අදාල වත්කම සහ ඒවායේ පිරිවැය එකම අංශය සදහන් කිරීම අවශ්‍ය වේ. | වැඩසටහන සදහා අදාල පිරිවැය වෙන් කල යුතුය. |
| (ඇ) | වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 2.1හි අවශ්‍යතා අනුව වැඩසටහනේ 3 කොටසේ කොන්ත්‍රාත්වරුවන්ට ගෙවිය යුතු රු.7,152,942 වටිනා බිල්පත් වාර්තා කර නොතිබුණි. එමනිසා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කෙරීගෙන යන වැඩ වටිනාකම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | ව්‍යාපෘතියේ නියම පිරිවැය නිරූපනය නොවන අතර කෙරීගෙන යන වැඩවල ශේෂය මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වේ. | ගෙවිය යුතු බිල්පත් වල මුල් අයිතමයන් තුන 2020 ජනවාරි ගිණුම්ගත කර ඇත. | වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 2.1 අනුව වැඩසටහන සදහා අදාල පිරිවැය වාර්තා කල යුතුය. |

**2.2 රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| ------------ | ---------------- | ------------ | ------------------- | -------------- |
| (අ) ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (අ) වගන්තිය | වැඩසටහනේ ගණුදෙනු වාර්තා කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් වෙනම ලෙජර ගිණුම් පවත්වාගෙන නොතිබුණි. | මූල්‍ය කළමණාකරණ පිළිබදව දුර්වල පාලනයන් | ණය ගිවිසුමේ 2.09 වගන්තිය අනුව ව්‍යාපෘති අංශය විසින් මොරගොල්ල ජල විදුලිබලාගාරය සහ හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති I-2 කොටස සදහා වෙනම ගිණුම් පොත් සහ මුල්‍ය ප්‍රකාශන පවත්වා ගනී. මෙම ව්‍යාපෘතිය සදහා වෙනම ලෙජර ගිණුම් පවත්වා ගැනීම සදහා පිරිවැය මධ්‍යස්ථාන අංක 980.62 සහ 980.63 2014 වර්ෂයේ දී මූල්‍ය ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගන්නා ලදී. එමනිසා මෙම නිරීක්ෂණය පිළිගත නොහැක. | වැඩසටහනට අදාල පිරිවැය හදුනාගැනීම සදහා වැඩසටහනේ සියළුම කොටස්වල ගනුදෙනු එක ඒකකයක් ලෙස සලකා වාර්තා කිරීම සදහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් වෙනම ලෙජර ගිණුම් පවත්වා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජූලි 26 දිනැති අංක 05 දරණ කළමණාකරන විගණන චක්‍රලේඛය | ව්‍යාපෘතියේ ගණුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත් වී නොතිබුණි. | දුර්වල අභ්‍යන්තර පාලනය පද්ධතියකි. | ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2020 වර්ෂයේදී ව්‍යාපෘතියේ 2 කොටසේ සිදුකරන ලද ගණුදෙනු සඳහා විස්තරාත්මක අභ්‍යන්තර විගණනයක් සිදු කර ඇත. | වැඩසටහනේ මෙහෙයුම් පිළිබදව කාර්යක්ෂමභාවය සහ ඵලදායිබව සහතිකවීමට ව්‍යාපෘතියේ කටයුතු පිළිබද අභ්‍යන්තර විගණන අංශය විසින් අඛණ්ඩව සමාලෝචනය කලයුතුය. |
| (ඇ) 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වැඩසටහන සමාලෝචිත කාලපරිච්ඡේදය තුලදී අදාල නිලධාරියාගේ වැටුපෙන් අඩු කිරීමකින් තොරව උපයනවිට ගෙවීම් බදු සහ බදු මත බදු රු. 12,012,424 ක් ඔවුන්ගේ අරමුදලින් ගෙවා තිබුණි. | වැඩසටහන් කළමණාකරන ඒකකයේ පිරිවැය වැඩිවේ. | ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ගේ උපයන විට ගෙවීම් බදු වගකීම ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරා ඇත. | උපයන විට ගෙවීම් බදු සේවකයින්ගේ දළ වැටුපෙන් අඩු කල යුතුය. |

**3. භෞතික කාර්සාධනය**

**3.1 වැඩසටහනේ කටයුතු පිළිබද භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

වැඩසටහනේ කටයුතු කොටස් 5කින් සමන්විතවන අතර ව්‍යාපෘතියේ එම කොටස්වල කටයුතු සුපරික්ෂණය සහ නියාමනය ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන සියළුම විදේශ ආධාර ව්‍යාපෘති සුපරික්ෂණය සඳහා වගකියන අතිරේක සාමාන්‍ය කළමණාකරු විසින් සිදුකිරීම වෙනුවට ලංකා විදුලිබල මණ්ඩලයේ විවිධ අංශ ප්‍රධානීන් යටතේ පවතී. එමනිසා වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු සතුටුදායක මට්ටමක නොතිබුණි. කොන්ත්‍රාත්වලට පිරිවැය වැඩිවීමට සහ දීර්ඝ කිරීම් වලට ඉඩදී වැඩසටහනේ කොටස් 5 ක ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය ඉලක්කවලට පසුපසින් පැවතුනි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| සංරචක | විගණන ගැටළු | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) ජල විදුලි උත්පාදනය | මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීමේ කටයුතුවල සත්‍ය සමස්ථ භෞතික කාර්යසාධනය සියයට 24 ක්ව පැවතුණු අතර ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශක පත් කිරීමේ ප්‍රමාදය, ලොට් ඒ වල ප්‍රසම්පාදන කටයුතු වල ප්‍රමාදයන් සහ අනුමත අධිකාරීන් විසින් පාරිසරික බලපෑම් පිළිබද තක්සේරු වාර්තාව සහ පාරිසරික බලපෑම් පිළිබදව තක්සේරු | දීර්ඝ කාලීන අඩු පිරිවැය සහිත විදුලි උත්පාදන සැලැස්මේ අරමුණු ඉටු නොවේ. | ව්‍යාපෘතියේ ප්‍රමාදයන්ට ප්‍රධාන හේතු වන්නේ<br>1.ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශක පත් කිරීමේ ප්‍රමාදය<br>2. ව්‍යාපෘති අනුමත කිරීමේ අධිකාරිය විසින් පාරිසරික බලපෑම් පිළිබද ත්ක්සේරු වාර්තාව සහ | බැදීම් ගාස්තු පැනවීම වැලැක්වීම සඳහා වැඩසටහනේ කටයුතු ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීම අවශ්‍යවන අතර ප්‍රමාදයකින් තොරව වැඩ සටහනේ අරමුණු ඉටුකර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | අතිරේක වාර්තාව සඳහා දීර්ඝ කිරීම් අනුමත කිරීම් ප්‍රමාදයන් හේතුවෙන් අපේක්ෂිත ඉලක්කය වූ සියයට 31 වඩා පිටුපසින් පැවතුණි. එම නිසා ප්‍රධාන කොන්ත්‍රාත්කරු වෙත 2019 දෙසැම්බර් සිට 2023 අගෝස්තු දක්වා කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. 01 කොටසේ සත්‍ය මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 3,084 ක් විය.එය අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය වූ රු.මිලියන 5,994 ට පිටුපසින් පැවතුණි. | | පාරිසරික බලපෑම් පිළිබඳ ත්ක්සේරු වාර්තාවේ අතිරේකය සඳහා දීර්ඝ කිරීම් අනුමත කිරීම් ප්‍රමාදය.<br><br>3. ව්‍යාපෘතිය අනුමත කිරීමේ අධිකාරිය විසින් සිදු කරන ලද ඉල්ලීමක් මත වේල්ල නැවත සැලසුම් කිරීම හේතුවෙන් ලොට් එ් (සිවිල් වැඩ) පිළිබඳ ප්‍රසම්පාදන ප්‍රමාදය. | |
| (ආ) සම්ප්‍රේෂණ යටිතල පහසුකම්වල ධාරිතාවය වැඩි දියුණු කිරීම. | පළාත්පාලන ආයතන විසින් පිරවුම් අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා බාධා පැනවීම හේතුවෙන් විදුලි සම්ප්‍රේෂණ යටිතල පහසුකම්වල ධාරිතාවය වර්ධනය කිරීම සඳහා සිදු කල යුතු කප්පායිතුරේ කොටුමා උපපොළ ඉදිකිරීම් කටයුතු සහ කෙරවලපිටිය, කටුනායක සහ ත්‍රිකුණාමලයේ කොටුමා උපපොලවල් වැඩිදියුණු කිරීමේ කටයුතුවල භෞතික ප්‍රගතිය වැඩසටහනේ කටයුතු ආරම්භකර වර්ෂ 4ක් ගතවීමෙන් පසුවද සියයට 90 ක අඩු ප්‍රතිශතයක පැවතුණි. තවද කැස්බෑව සහ කළුතර කොටුමා උපපොළවල් ඉදිකිරීමේ සහ අනුරාධපුර, අනුරාධපුර නව නගරයේ පැවති පැරණි කොටුමා උපපොළවල් වැඩිදියුණු කිරීමේ කටයුතුවල ප්‍රගතිය සියයට 69.5 ක්ව පැවතුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට ඊට සමගාමී සම්ප්‍රේෂණ ජාල ඉදිකිරීමේ කටයුතු සියයට 96.8 ක පැවතුණි. පළාත්පාලන ආයතන විසින් පිරවුම් අමු | -එම- | මෙම ව්‍යාපෘතියේ ලොට් ඒ කොන්ත්‍රාත්තුව 2016 මාර්තු 15 දින සිට බලපැවැත්වෙන අතර වර්ෂ 2ක කොන්ත්‍රාත්තුවක් නිසා 2018 මාර්තු 15 දිනට නිම කල යුතුය. 2019 දෙසැම්බර් 15 දක්වා කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබේ. 2019 දෙසැම්බර් 31 දින වන විට කෙරවලපිටිය, කටුනායක සහ ත්‍රිකුණාමලයේ කොටුමා උපපොළවල්වල වැඩිදියුණු කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇති අතර වාණිජමය වශයෙන් බලශක්තිය උත්පාදනය කෙරේ. පළාත් පාලන ආයතන වලින් පිරවුම් අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා බාධා පැනවීම හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ සැලකිය යුතු වැඩ ප්‍රමාණයක් ඇති කප්පයිතුරෙයි වැඩ බිමෙහි ඉඩම් ගොඩ | -එම- |

ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා බාධා පැනවීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ඉලක්කය වූ සියයට 100 ට පසුපසින් පැවතුණි.

කිරීමේ ප්‍රගතිය බලපාන ලදී. තවද ව්‍යාපෘතියේ කටයුතුවල ප්‍රමාදය සඳහා පාස්කු ඉරු දින ප්‍රහාරය සමග පැවති තත්වයද හේතු විය. මෙම අනපේක්ෂිත තත්වයන් නිසා කොන්ත්‍රාත්කරු කාලය දීර්ඝ කිරීම් ඉල්ලා ඇති අතර එය සමාලෝචනය කරමින් පවතී. තවද මෙම ව්‍යාපෘතියේ ලොට් බී1 කොන්ත්‍රාත්තුව 2016 නොවැම්බර් 04 දින සිට බලපැවැත්වෙන අතර වර්ෂ 2 ක කොන්ත්‍රාත්තුවක් නිසා 2018 නොවැම්බර් 04 දිනට නිම කල යුතුය. 2019 නොවැම්බර් 03 දක්වා කාලය දීර්ඝ කිරීම් ලබා දී ඇත. 2019 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර නව නගරයේ කොටුමා උපපොළෙහි වැඩිදියුණු කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇති අතර 2020 ජනවාරි වාණිජ වශයෙන් බලශක්තිය උත්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ. ඉහත ලොට් ඒ සහ ලොට් බී කොන්ත්‍රාත් සඳහා සමගාමී සම්ප්‍රේෂණ රුහැන් ඉදිකිරීමකින් සමන්විත වේ. 2019 දෙසැම්බර් 31 දින වන විට කළුතර, කැස්බෑව සහ ත්‍රිකුණාමලයේ සම්ප්‍රේෂණ රුහැන් කොටස අවසන් කර ක්‍රියාත්මක කර ඇත. මෙම කොන්ත්‍රාත්තුවේ

| | | | | |
|---|---|---|---|---|
| | | | අනුරාධපුර කොටසේ රුහැන් ඇදීම සම්පූර්ණ කල යුතු අතර සියයට 98ක් සම්පූර්ණ කර තිබේ. මෙම කොන්ත්‍රාත්තුව 2020 ජනවාරි වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. | |
| (ඈ) මධ්‍යම වෝල්ටීයතා ජාලය කාර්යක්ෂම කිරීම | ඉඩම් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් වවුනතිව් සහ මාදම්පේ මධ්‍යම වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම 2019 දෙසැම්බර් 31 දිනට කිලෝමීටර් 92, කිලෝවොට් 33 ක මධ්‍යම වෝල්ටීයතා රුහැන් ස්ථාපනය සහ මධ්‍යම වෝල්ටීයතා රුහැන් සහ ගැන්ට්‍රි ඉදිකිරීම් කටයුතු වල භෞතික ප්‍රගතිය සියයට 90 ක පැවතුණි. 2020 පෙබරවාරි 25 දිනැති අංක 20.03.049 දරණ මණ්ඩලයේ සාකච්ඡා සටහනට අනුව පවතින නීතිමය ගැටළු සහ මණ්ඩලයේ පාලනයෙන් බැහැරව පවතින නිසා මෙම ගැටළු අඛණ්ඩව සිදුවීම අපේක්ෂා කරන නිසා ව්‍යාපෘතියේ මෙම කොටස මණ්ඩලයේ බෙදාහැරීම් අංශය 02 වෙත සමාලෝචනය කර භාරදී තිබුණි. | -එම- | ලංකා විදුලිබල මණ්ඩලයේ පාලනයෙන් බැහැරව පවතින කුළුණු පිහිටන ස්ථානය පිළිබඳ පවතින නීතිමය ගැටළු නිසා වවුනතිව් රුහැන් ඇදීමේ කටයුතුවල ප්‍රගතියට බලපා ඇත. | -එම- |
| (ඈ) බලශක්ති කාර්යක්ෂමතාව සඳහා ඉල්ලුම කළමණාකරනය කිරීම | ස්මාර්ට් මීනුම් කිරීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රදානය කර තිබුණු අතර සැලසුම් කල දින සිට මාස 10ක් ගතවීමෙන් පසු 2019 ජුලි 30 දින නිමකර තිබුණි. තවද, ඉල්ලුම් කළමණාකරන ව්‍යාපෘති සංකල්පය යටතේ සිදුවූ | වියපැහැදම් නොවු ශේෂ මත බැදීම් ගාස්තු අය කෙරේ. | අදහස් දක්වා නොමැත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | බාහිර පාරිසරික වෙනස්කම් හේතුවෙන් ඉහත සඳහන් සංරචකය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීමට නියමිතව තිබුණු ස්මාර්ට් මීනුම් කිරීමේ නියමු ව්‍යාපෘතිය සහ තාප ගබඩා කිරීමේ නියමු ව්‍යාපෘතිය යටතේ කටයුතු පසුව අවලංගු කර තිබුණි. | | | |
| (ඉ) 5වැනි කොටස- ධාරිතා වර්ධන සඳහා සහය සැපයීම | උපදේශක දෙවැනි කොටසේ නව ව්‍යාපෘතිය සකස් කිරීම සම්බන්ධ අවසන් වාර්තාව 2016 අගෝස්තු 12 දින ඉදිරිපත් කිරීම හේතුවෙන් විදුලිබල අංශයේ සංවර්ධනය, පද්ධති සහ බෙදාහැරීම් සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ආයතනික ධාරිතාවය වැඩිදියුණු කිරීම වෙනුවෙන් උපදේශන සේවා සැපයීම ආරම්භ කර නොතිබුණි. උපදේශන සේවා මත කොන්ත්‍රාත්තුව 2018 පෙබරවාරි 12 නිමකර තිබුණි. ණය නියෝජිත ආයතනය විසින් 2කොටස සකස් කිරීමේ කටයුතු සඳහා වැඩසටහන් කළමණාකරන සහාය වෙනුවෙන් උපදේශන සේවා සැපයීමට කරන ලද රු.33,411,948 කට සමාන එජඩො 851,150 ක වෙන්කිරීමෙන් 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.14,039,953කට සමාන එජඩො 577,393 ක් පමණක් උපයෝජනය කර තිබුණි. | වියපැහැදම් නොවූ ශේෂ මත බැදීම් ගාස්තුඅය කෙරේ. | අදහස් දක්වා නොමැත. | -එම- |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටළුව | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| වැඩසටහනේ කටයුතු කොටස් 5කින් සමන්විත වන අතර වැඩසටහනේ එම කොටස්වල කටයුතු අධීක්ෂණය සහ නියාමනය ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන සියළුම විදේශ අධාර ව්‍යාපෘති අධීක්ෂණය සඳහා වගකියනු ලබන අතිරේක සාමාන්‍ය කළමණාකරු වෙනුවට ලංකා විදුලිබල මණ්ඩලයේ විවිධ අංශ ප්‍රධානීන් යටතේ පවතී. එම නිසා වැඩසටහනේ කොටස්වල සම්බන්ධීකරණය සතුටුදායක මට්ටමක නොපැවතුණි. පිරිවැය වැඩිවීමට සහ අදාල කොන්ත්‍රාත්වල කාලය දීර්ඝ කිරීම්වලට අවස්ථාව ලබා දී වැඩසටහනේ කොටස් 5 සම්බන්ධ ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය අපේක්ෂිත ඉලක්ක වලට පසුපසින් පැවතුණි. | අධීක්ෂණය සහ නියාමන යාන්ත්‍රණය දුර්වල මට්ටමක පැවතුණු අතර වැඩසටහනේ කටයුතුවල නිමකිරීමේ මන්දගාමී ප්‍රගතියක් දැක්වීය. | අදහස් දක්වා නොමැත. | වැඩසටනේ කටයුතු අධීක්ෂණයට සහ නියාමනය සඳහා වගකියන ජ්‍යෙෂ්ඨ කළමණාකරන නිලධාරියකු පත්කිරීම අවශ්‍ය වේ. |